## 483 දෙව් සමිඳුන්ගේ

දෙව් සමිඳුන්ගේ සේවෙට කැපවූ
කිතුබැති අදරැති සොහොයුරෙනි
ඔබහට ජයවේ ඔබහට තුති වේ
නිදුකින් ඔබ දිගු කල් සැරදේ

ලෝ සැප දුරලා කිතුතුම සමගින්
ජයටැඹ දෙසටමැ ලංවන්නේ
මරි මව් සරණය වෙයි රකවරණය
පිවිතුරු හදවත් පොපියන්නේ

බිය සැක නොමැතිව මුළු දිවි පෙවෙතම
ජේසු තුමන් හට කැප කෙරුවේ
කොතරම් කරදර බාධක ආවත්
කිසි දින නෑ ඔබ පසු බැස්සේ

යුක්තිය සමගිය පෙරදැරි කරගෙන
අදම්ටූ මනු ලොව ජයගන්නේ
සමිඳුන් නිවසේ සැනසුම ලබමින්
කිතුදම දස අත පතුරන්නේ